*සැ. යු.* - මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2008 වර්ෂයේ අප්‍රේල් -ජුනි කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,762 - 2012 ජුනි මස 08 වැනි සිකුරාදා - 2012.06.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 776 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 776 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 779 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 787 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - (i) දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) හිස්බුල්ලාහ් පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 මාර්තු මස 30 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) දක්ෂිණ ලංකා තෘතියික අධ්‍යාපන හා නායකත්ව පුහුණු පීඨය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2012 අප්‍රේල් මස 20 වැනි දින*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ජුනි මස 15 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ජුනි මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2012 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීම**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2012***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමට මිල ගණන් 2012 ජුනි මස 28 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවල දී භාරගනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම් පත්‍ර කාර්යාල වේලාවන් තුළ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250.00 ක (රුපියල් දෙසීය පනහක) මුදලක් ගෙවා 2012 ජුනි මස 28 වැනි දින මධ්‍යහ්න 12.00 තෙක් ලබාගත හැක.

උපලේඛනය

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබාගත හැකි ස්ථාන* | *මිල ගණන් භාරගැනීම* |
|---|---|---|---|---|
| සබරගමුව පළාත | කෑගල්ල | ගලිගමුව (බිම් සවිය) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (සබරගමුව පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, (කෑගල්ල) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (සබරගමුව පළාත) නව නගරය, රත්නපුර |
| බස්නාහිර පළාත | කොළඹ | දෙහිවල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, (කොළඹ) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත) කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05 |
| බස්නාහිර පළාත | කොළඹ | හෝමාගම | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, (කොළඹ) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත) කිරුළ පාර, නාරාහේන්පිට, කොළඹ 05 |

කවරයේ ඉහළ වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිල ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තර ද සහිතව 2012 ජුනි මස 28 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2012 මැයි මස 25 වැනි දින,
කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

06-445

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**කල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

2012 ජූලි මස සිට 2013 ජුනි මස දක්වා රා තැබෑරුම් රේන්ද විකිණීම

**2012/2013 වර්ෂය**

2012 ජූලි මස 01 වැනි දින සිට 2013 ජුනි මස 30 වැනි දින දක්වා මාස 12 ක කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 2007 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම, ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල, තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුණේ වම් කෙළවරෙහි "අංක ................................ දරන ................................ රා තැබෑරුම සඳහා" යනුවෙන් හා පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට 2012.06.14 වැනි දින පෙ. ව. 10.00 ට පෙර කල්පිටිය ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 2007 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2012.06.14 වැනි දින පෙ. ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ දී සියලුම ටෙන්ඩර්කරුවන් කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2012.06.18 වැනි දින පෙ. ව. 10.00 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම ද මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුයි.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. පී. රංගන ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
කල්පිටිය.

2012 මැයි මස 18 වැනි දින,
කල්පිටිය ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *තැබෑරුම* | *ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|---|
| 01. | කල්පිටිය | දළුව | රා | 2012.06.14 වැනි දින පෙ. ව. 10.00 | 1,000 |
| 02. | කල්පිටිය | ඒත්තාල | රා | 2012.06.14 වැනි දින පෙ. ව. 10.00 | 1,000 |

06-279

---

**මඩකලපුව දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් රේන්ද විකිණීම - 2012/2013**

අංක 207 දරන 1982.08.20 දින ප්‍රකාශ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළ කරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයේ පහත සඳහන් රා තැබෑරුම් සඳහා 2012 ජූලි මාසයේ පළමු වැනි දින සිට 2013 ජූනි මාසයේ 30 වැනි දින දක්වා රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා මඩකලපුව දිසාපති විසින් මඩකලපුව කච්චේරියේ දී බාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් පැමිණ සිටිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1,000 ක මුදලක් මඩකලපුව කච්චේරියේ තිබෙන ලංකා බැංකු ශාඛාවේ දිසාපති නමින් ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත් ලබා ගත හැක. ටෙන්ඩර්පත් සමග රිසිට්පත අමුණා තිබිය යුතු යි. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ 2012.06.21 දින මධ්‍යාහ්න 12.00 දක්වා වේ. ටෙන්ඩර්පත් 2012.06.21 දින ප.. ව. 3.00 ට විවෘත කරනු ලැබේ.

02. අංක 207 දරන 1982.08.20 වැනි දින පළ කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ දැක්වෙන රා තැබෑරුම් බදු විකිණීමේ කොන්දේසිය අනුව ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන රුපියල් ලක්ෂ දහයක් වටිනා තක්සේරු වාර්තා එක් එක් ටෙන්ඩර් පත් සමග අමුණා තිබිය යුතුය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේනම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් කමිටුවේ තීරණයට අනුව බදු ගත් අය බදු ගත් දිනයේ සිට 2012.06.29 දින ඇතුළත එක් වර්ෂයක් සඳහා බදු මුදල් සියල්ල ගෙවා ගිවිසුමක අත්සන් කළ යුතු යි.

05. බදුකරු බදුපත්‍ර හා කොන්දේසි පත්‍රවල අත්සන් තැබිය යුතු ය.

06. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර් පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන ලද දින සිට සති දෙකක් ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

07. දැනට තිබෙන තැබෑරුම් ඉඩම් ඉදිරි කාලවලටත් තිබේදැයි සහතික නැත.

08. බදු ගත් අය අවශ්‍ය විටක දිසාපති විසින් සඳහන් කරනු ලබන මුදලක් ආරක්ෂක තැන්පතු මුදලක් වශයෙන් ගෙවිය යුතු ය.

09. ලියාපදිංචි කරන ලද සංගම් මෙම ‍රේන්ද විකිණීමේ දී සහභාගි වන්නේ නම් සංගම පිහිටා තිබෙන ප්‍රදේශයට අදාල රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකිය. ඒ සමග සංගමය දැනට ක්‍රියාත්මක වන බවටත් සංගමය විසින් රා තැබෑරුම බදු ගෙන පවත්වා ගෙනයෑමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 දරන හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛයට අනුව)

10. අනිකුත් තොරතුරු මඩකලපුව කච්චේරියෙන් ලබා ගත හැක.

එස්. අරුමයිනායහම්,
දිසාපති හා දිස්ත්‍රික් ලේකම්,
මඩකලපුව දිස්ත්‍රික්කය.

2012 මැයි මස 14 වැනි දින.

**රා තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථාන**

| *අංකය* | *රා තැබෑරුමට අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම් තිබෙන ස්ථාන* | *ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනය හා වේලාව* | |
|---|---|---|---|---|
| | | | *දිනය* | *වේලාව* |
| 01. | එරාවූර්පත්තු | ආරුමුගන්නාන්කුඩියිරුප්පු ගමේ | 2012.06.21 | දහවල් 12.00 දක්වා |
| 02. | මන්මුනේ උතුර | මඩකලපුව මහනගර සභා මායිම තුළ | 2012.06.21 | දහවල් 12.00 දක්වා |
| 03. | මන්මුනේපත්තු | ආරයම්පදි ගම | 2012.06.21 | දහවල් 12.00 දක්වා |
| 04. | මන්මුනේ දකුණ එරුවිල්පත්තු | මාංකාඩු ගම | 2012.06.21 | දහවල් 12.00 දක්වා |
| 05. | කෝරලේපත්තු උතුර | වාකරේ උතුර ග්‍රාම නිලධාරි වසම | 2012.06.21 | දහවල් 12.00 දක්වා |
| 06. | මන්මුනේ දකුණ එරුවිල්පත්තු | එරුවිල් ගම | 2012.06.21 | දහවල් 12.00 දක්වා |

***සටහන .-*** 1. ටෙන්ඩර් කමිටුව 2012.06.21 දින ප. ව. 3.00 ට රැස්වේ.

2. විකුණුම් දිනයේ සුදුසු බදුකරු තෝරා නොගතහොත් නැවත විකිණීම 2012.06.26 වැනි දින පෙ. ව. 10.00 ට පැවැත්වේ.

06-369

# රජයේ නොවන දැන්වීම්

## සීමිත සමාගම් ඒකාබද්ධ කිරීමේ පොදු නිවේදනය

කැළණි වැලි ග්‍රීන් ටී (ප්‍රයිවට්) ලිමිටඩ්
(සමාගම් අංක PV 4816)

සහ

කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී
(සමාගම් අංක PQ 58)

කැළණි වැලි ග්‍රීන් ටී (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක PV 4816) සහ කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී (සමාගම් අංක PQ 58) යන සමාගම් ද්විත්වය 2007 අංක 07 දරන සමාගම් පනතේ 242 ඡේදයේ සඳහන් කොන්දේසි පරිදි තනි සමාගමක් ලෙස ඒකාබද්ධ කරනු ලබන බව, සමාගම් පනතේ 242 (3) b වැනි ඡේදය යටතේ මින් නිවේදනය කරනු ලැබේ.

ඒකාබද්ධ කරන ලද නව සමාගමේ නාමය කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී වන අතර මෙම ඒකාබද්ධය බල ගැන්වෙනු ලබන්නේ 2012 ජුනි 29 වැනිදා හෝ සමාගම් ලියාපදිංචි කිරීමේ ජෙනරාල්වරයා විසින් අනුමත කරන දිනයක දී විය හැක.

ඒකාබද්ධවීමෙන් පසු කැළණි වැලි ප්ලාන්ටේෂන්ස් පීඑල්සී සමාගමේ ලියාපදිංචි කාර්යාලය, අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 පිහිටුවනු ලැබේ.

ඒකාබද්ධ කරනු ලබන සමාගමේ යම් කොටස් හිමියකු, ණය හිමියකු හෝ ඒකාබද්ධ කරනු ලබන සමාගම සමග බැඳීමකට යටත්ව ඇති යම් තැනැත්තකු විසින් පරීක්ෂා කිරීම සඳහා ඒකාබද්ධ යෝජනාවේ පිටපත් ඒකාබද්ධ සමාගම්හි ලියාපදිංචි කාර්යාලය වන අංක 400, ඩීන්ස් පාර, කොළඹ 10 වෙතින් සේවා කාලයක් තුළ දී නොමිලේ ලබාගත හැක.

ඒකාබද්ධ වන සමාගම් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10,
2012 මැයි මස 28 වැනි දින.

06-429

---

## ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (2) වගන්තිය යටතේ නිවේදනය

පහත නම සඳහන් සමාගමෙහි නාමය, 2007 අංක 07 දරන සමාගම් පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව 2011 අගෝස්තු මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කරන ලදී.

සමාගමේ පෙර පැවති නාමය : මැබ්රොක් ඊ -ටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 5483
ලියාපදිංචි කාර්යාලය : අංක 305/9, 1/1, නාවල පාර, රාජගිරිය
සමාගමේ නව නාමය : ඊලොජික් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් .

අධ්‍යක්ෂ.

06-437

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි

සමාගමේ නාමය : සීකාබ් (පුද්ගලික) සමාගම
ලි/ප අංකය හා දිනය : පී වී 80307, 2011.07.27
ලි/ප කාර්යාලය : අංක 247, මැදගොඩ පාර, දම්පැලැස්ස, නාරම්මල.

එස්. එච්. එස්. සමරකෝන්,
අධ්‍යක්ෂ.

06-436

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි

සංස්ථාගත කළ දිනය : 2012.05.02
නම: ඩිපටේන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85651
ලියාපදිංචි ලිපිනය : 52/1 ඒ, නාලක සෝමවර්ධන මාවත, කුඩා බුත්ගමුව, කොටිකාවත්ත, අංගොඩ.

කළම්බෝ කෝපරේට් සර්විසස් (පීවීටී) එල්ටීඩී,
ලේකම්වරු.

06-448

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පළකල යුතු නිවේදනය

සමාගමේ නම : පැරඩයිස් වොයේජස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2012.02.28
ලියාපදිංචි අංකය : පී වී 84589
ලියාපදිංචි කාර්යාලය : අංක 75 සී 1/1, මිරිහාන පාර, නුගේගොඩ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අධ්‍යක්ෂ.

2012 මැයි මස 21 වැනි දින.

06-434

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි :

සමාගමේ නම : සියා වෙස්ටර්න් ගෘෘප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2012 ජනවාරි 26 වැනි දින
සමාගමේ අංකය : පී වී 83941
ලියාපදිංචි ලිපිනය : අංක 154, පල්ලිය පාර, මට්ටක්කුලිය, කොළඹ 15.

මණ්ඩලයේ අණ පරිදි.

06-431

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි :

සමාගමේ නම : කොමො ටෙක්නොලොජීස් (පීවීටී) එල්ටීඩී
සංස්ථාගත කළ දිනය : 2012 මැයි 22 වැනි දින
සමාගමේ අංකය : පී වී 86096
ලියාපදිංචි ලිපිනය : අංක 135/2/18, දෙවැනි මහල, නබීසා කඩ සංකීර්ණය, කොටුගොඩැල්ල වීදිය, මහනුවර.

මණ්ඩලයේ අණ පරිදි.

06-430

---

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ජේ එස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2011 නොවැම්බර් මස 14 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ජේ එස් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 82475
ලියාපදිංචි ලිපිනය : අංක 87, කොට්ටාව පාර, මාම්පේ, පිළියන්දල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

06-426

---

## සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය

සමාගමේ නම : දා පර්ෆියුම් ස්ටෝර් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 85988
සංස්ථාගත කළ දිනය : 2012.05.16
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 46/8, ශ්‍රී සුමංගල පාර, රත්මලාන.

දා පර්ෆියුම් ස්ටෝර් (පීවීටී) එල්ටීඩී,
සමාගම් අධ්‍යක්ෂ.

2012 මැයි මස 18 වැනි දින.
06-392

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, 2012 අප්‍රේල් මස 27 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනය

සමාගමේ නම : ඉකොලොජිකල් ලෑන්ඩ් ඩිවලොප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 85673
ලියාපදිංචි ලිපිනය : අංක 38, ගොල්ෆේස් කෝට් 02, කොළඹ 03.

මණ්ඩලයේ අණ පරිදි,

මයිඩාස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2012 මැයි මස 16 වැනි දින.

06-390

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, 2012 අප්‍රේල් මස 27 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනය

සමාගමේ නම : ආත්මාන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 85674
ලියාපදිංචි ලිපිනය : අංක 38, ගෝල්පේස් කෝට් 02, කොළඹ 03.

මණ්ඩලයේ අණ පරිදි,

මයිඩාස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

2012 මැයි මස 16 වැනි දින.

06-389

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර, ෆ්‍රී ලංකා ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමේ නම සිලෝන් එස්ටේට් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් නම වෙනස් කිරීම පිළිබඳව මෙයින් දැනුම් දෙන්නෙමු.

සමාගමේ පෙර පැවති නම : ෆ්‍රී ලංකා ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 5528
ලියාපදිංචි ලිපිනය : අංක 228, හැව්ලොක් පාර, කොළඹ 05
නව නාමය : සිලෝන් එස්ටේට් ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් .

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝග ප්‍රකාර,

සිලෝන් සෙක්‍රටේරියල් සර්විස් සමාගම,
ලේකම්වරු.

06-378

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 : 1 වගන්තිය අනුව දැනුම්දීම

සමාගමේ නම : රුවී ඉන්ටනැෂනල් ප්‍රයිවට් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85879
ලියාපදිංචි ලිපිනය : බෙත්ලෙහෙම්, තල්විල, මාරවිල
ලියාපදිංචි දිනය : 2012.05.10 .

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

06-373

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී :-

සමාගමේ නම : ඕරල් ඕරල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 78989
ලියාපදිංචි කළ දිනය : 2011 මැයි 24
ලියාපදිංචි කළ ලිපිනය : අංක 97/4, පන්සල පාර, මහරගම.

කළමනාකරණ අධ්‍යක්ෂ.

2012 මැයි මස 24 වැනි දින,
අංක 221 1/1, කිරුළ පාර,
නාරාහේන්පිට.

06-344

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : සිවන් හියුමන් ඩිවලොප්මන්ට් ඇසෝසියේෂන්
සමාගමේ අංකය : ජීඒ 2696
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 48, සෙයින්ට් මේරීස් පාර, ත්‍රිකුණාමලය
සංස්ථාගත කිරීමේ දිනය : 2012.05.04.

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

06-345/1

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : සත්ලක් කොමියුනිටි ඩිවලොප්මන්ට් එලායන්ස් එල්ටීඩී
සමාගමේ අංකය : ජී එල් 2178
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 272/20, ඉසුරු උයන, බටපොත, මඩල්ගමුව, ගම්පහ
සංස්ථාගත කිරීමේ දිනය : 2012.02.21.

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

06-345/2

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : වර්ට්ලෙක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 85786
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 553, දලගාහාවත්ත පාර, බොරලැස්ගමුව
සංස්ථාගත කිරීමේ දිනය : 2012.05.04.

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

06-345/3

### දැන්වීමයි

2007 අංක 7 සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව

සමාගමේ නම : අයින්ගරන් ඉන්ටර්නැෂනල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 85341
ලියාපදිංචි ලිපිනය : දෙවැනි මහල, අයිබීඑම් ගොඩනැගිල්ල 2, අංක 48, නවම් මාවත, කොළඹ 02;

සමාගමේ නම : ඊ. එන්. ආර්. හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85512
ලියාපදිංචි ලිපිනය : අංක 15, මහවත්ත පාර, ඉඹුල්දෙනිය, මිරිහාන, නුගේගොඩ;

සමාගමේ නම : ස්පේස් එන් ස්පේස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 85352
ලියාපදිංචි ලිපිනය : අංක 1, සුලෙයිමන් ටෙරස්, ජාවත්ත, කොළඹ 5 ;

සමාගමේ නම : මැග්නා සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85460
ලියාපදිංචි ලිපිනය : අංක 129/48, දුටුගැමුණු වීදිය, කොළඹ 06 ;

සමාගමේ නම : සැන්සොන්ස් ගෲප් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 85618
ලියාපදිංචි ලිපිනය : අංක 311, පරණ යොන් වීදිය, කොළඹ 12.

06-346

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සමාගමක් ලෙස ස්ථාපිත කළ බව නිවේදනය කිරීම

සමාගමේ නම : කැනේඩියන් ඉමිග්‍රේෂන් ස්පෙෂලිස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 85710
සංස්ථාපිත දිනය : 2012.04.30
ලියාපදිංචි කාර්යාලය : අංක 272/ජී, දෙහිවල පාර, බෙල්ලන්විල, බොරලැස්ගමුව.

එච්. ඒ. ඊ. බී. එච්. කුමාර,
ලේකම්වරු.

06-363

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ගලේවෙල, කනාදන දිවුල්ගස්කොටුව පාර, වාසනා නිවස, අංක 258 හි පදිංචි මනන්කන්දගේ රංජන් චමින්ද ජයලත් දිසානායක වන මම, මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් ඉහත කී ලිපිනයේ ම පදිංචි පෙත්තපෙරුම ආරච්චිලාගේ වාසනා ප්‍රියදර්ශනි දිසානායක මහත්මිය පත් කරමින් කේ. එල්. රම්‍යා කොතලාවල, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2011.05.11 වැනි දින ලියා සහතික කරන ලද අංක 2014 දරන ඇටෝර්නි බලපත්‍රය අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කර ඇති බවත් වර්ෂ 2012 ක් වූ මැයි මස 25 වැනි දින සිට එකී පෙත්තපෙරුම ආරච්චිලාගේ වාසනා ප්‍රියදර්ශනි විසින් මගේ නමින් සහ/හෝ මා වෙනුවෙන් අරමුණ ලෙස සිදුකර ඇති කවර හෝ ක්‍රියාවකට/ක්‍රියාවන්ට මා නොබැඳෙන්නේය හෝ වගනොකියන්නේ ය යනුවෙන් ශ්‍රී ලංකා රජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

මනන්කන්දගේ රංජන් චමින්ද ජයලත් දිසානායක.

2012 ක් වූ මැයි මස 25 වැනි දින දී ය.

06-361

---

## නිවේදනයයි

යග්ගහ හෙට්ටිආරච්චි සදුන් අමිල රාජ් හෙට්ටිආරච්චි වන මා විසින් මා වෙනුවෙන් ඇටෝර්නි බලකරු ලෙස නීතිඥ සෞම්‍ය හෙට්ටිආරච්චි විසින් ලියා සහතික කරන ලද අංක 70 හා 2012.02.01 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ 03 වෙලුමේ 42 පත් ඉරුවේ 1347 දිනපොතේ ලියාපදිංචි කර ඇත. ඒ මත ඇටෝර්නි බලකරු ලෙස පත් කරන ලද මාකොළ, මාකොළ උතුර, දේවාල පාර, අංක 130/4 දරන ලිපිනයේ පදිංචි බියගම අචාරිගේ ඉරොන් සංජීව පෙරේරා (ජා. හැ. අංක 782990187 V) වෙත ලබා දී තිබූ ඇටෝර්නි බලපත්‍රය 2012.05.20 වැනි දින සිට මෙයින් අවලංගු කරනු ලැබේ. මින් මතු එකී බියගම අචාරිගේ ඉරොන් සංජීව පෙරේරා (ජා. හැ. අංක 782990187 V) යන අය මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක වගකීමකට මා විසින් යටත් නොවන බවත් ප්‍රකාශ කර සිටිමි.

යග්ගහ හෙට්ටිආරච්චි සදුන් අමිල රාජ් හෙට්ටිආරච්චි.
ඇටෝර්නි අධිපති.

06-360

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු :-

සමාගමේ නම : ක්‍රියේටිව් වින්ග්ස් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 60092
සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 22 සී, සාන්ත සිල්වෙස්ටර් පාර, ගල්කිස්ස
සමාගම් ලේකම්වරු : එච්ටීපී බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලිපිනය : 3 වැනි මහල, වෙස්ට් වින්ග්, මෙතෝදිස්ත ගොඩනැගිල්ල, අංක 2/5, දුම්රියපොල පාර, කොළඹ 03.

06-359

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු :-

සමාගමේ නම : ඒ. එස්. ප්‍රඩක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 71368
සමාගමේ ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 327/8 බී, 1 වැනි පටුමග, බොපෙත්ත, ගොතටුව
සමාගම් ලේකම්වරු : එච් ටී පී බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලිපිනය : 3 වැනි මහල, වෙස්ට් වින්ග්, මෙතොදිස්ත ගොඩනැගිල්ල, අංක 2/5, දුම්රියපොළ පාර, කොළඹ 03.

06-358

---

## නිවේදනයයි

වර්ෂ 2007 සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු :-

ලියාපදිංචි සමාගමේ නම : ටෝර්ස් එන්ටප්‍රයිසස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 73 2/1, ටෙම්පල්ස් පාර, ගල්කිස්ස
ලියාපදිංචි අංකය : පී වී 71794.

එච්. ටී. පී. බිස්නස් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 2/5, දුම්රියපල පාර,
කොළඹ 03.

06-357

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීමේ දැන්වීම

කොළඹ 05, පාර්ක් පාර, අංක 40/3, පදිංචි ඒබ්‍රහිම් ගාර්ඩිනර් මිලින්ද රාජාස් මුත්තයියා වන මා විසින් ශ්‍රී ලංකාවේ මහජනයා වෙත දැනුම් දී සිටින්නේ කොළඹ 04, කින්ස් රෝස් ඇවනියු, අංක 43/1 හි පදිංචි එහි කැතරින් සොනාලි දමයන්ති බ්‍රිටෝ මුරුනයාගම් (විවාහයට පෙර

මුත්තයියා) වෙත මා විසින් පවරා දෙන ලද ඇමරිකාවේ බොස්ටන් හි ලියා සහතික කරන ලද 2000.05.24 දින දරන ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බවටත් එම නිසා මෙතැන් පටන් කැතරින් සොනාලි දමයන්ති බ්‍රිටෝ මුරුනයාගම් (විවාහයට පෙර මුත්තයියා) විසින් මා වෙනුවෙන් ගනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් මා වගකීමක් නොදරන බවත් ය.

ඒබ්‍රහිම් ගාර්ඩිනර් මිලින්ද රාජාස් මුත්තයියා.

06-355

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව, කොළඹ 14, ග්‍රෑන්ඩ්පාස්, සා. ජෝශප් වීදියේ, ඊ/ජී/4, සමගිපුර, තට්ටු නිවාස සංකීර්ණයේ පිහිටි තිසීමා ෂිපින් ඇන්ඩ් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය 2012.01.13 දින පී. වී. 83705 යටතේ සංස්ථාපනය කරන ලදී.

මණ්ඩලයේ අණ පරිදි,

එම්. එස්. මොහොමඩ් ෆාරිස්, එල්. එල්. බී. (කොළඹ)
නීතිඥ සහ සමාගම් ලේකම්.

අංක 30 - 1/1, විල්සන් වීදිය, කොළඹ 12.

06-220

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය, ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි :-

සමාගමේ නම : හෝටේල් ඩිපෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 85853
ලියාපදිංචි ලිපිනය : අංක 238/2 බී, බටපොත කනත්ත පාර, රොබට් ගුණවර්ධන මාවත, බත්තරමුල්ල
සංස්ථාගත කළ දිනය : 2012 මැයි 09.

ගන්ලත්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

ගලදාරි හෝටලය,
අංක 64, ලෝටස් පාර,
කොළඹ 01.

06-229

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය, ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි :-

සමාගමේ නම : ග්ලෝබල් ට්‍රස්ට් ෆිනෑන්ෂල් සර්විසස් ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී බී 3773
ලියාපදිංචි ලිපිනය : අංක 1, කාසල් ඇවනියූ, කොළඹ 08
සංස්ථාගත කළ දිනය : 2009 සැප්තැම්බර් 17.

ගන්ලත්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

ගලදාරි හෝටලය,
අංක 64, ලෝටස් පාර,
කොළඹ 01.

06-228

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වගන්තිය, ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට ප්‍රකාරව කරනු ලබන නිවේදනයයි :-

සමාගමේ නම : එස්. පී. ලංකා පෙට්රෝලියම් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 85851
ලියාපදිංචි ලිපිනය : අංක 186/2, බදුරලිය පාර, බෙල්ලන, අගලවත්ත (කේඑල්)
සංස්ථාගත කළ දිනය : 2012 මැයි 09.

ගන්ලත්ස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

ගලදාරි හෝටලය, අංක 64, ලෝටස් පාර, කොළඹ 01.

06-227

---

## ඇටර්නි බලය අවලංගු කිරීම

අටකලන්පන්න, ඇත්තලවත්ත, උප්පැන්න මරණ රෙජිස්ට්‍රාර් කාර්යාලය යන ලිපිනයේ පදිංචි මලිගස්පේ කෝරලගේ සුනිල් (ජා. හැ. අංක 641470511V) වන මගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකරු ලෙස ගාල්ල, බෝපේ, එගොඩකනත්ත පදිංචි මලිගස්පේ කෝරලගේ හේමචන්ද්‍ර යන අය පත්කරමින් ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩබ්. විතාරණ මහතා ලියා සහතික කළ අංක 4130 හා 2008.06.30 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය 2012.05.17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

එම්. කේ. සුනිල්.

06-225

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වගන්තිය ප්‍රකාර

නම : ලිෆ්ට් ඩිසයිනර් වෙයා (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 78255
ලියාපදිංචි ලිපිනය : අංක 7/100 බී, සෙලින්කෝ නිවාස, පාසැල් මාවත, විජේරාම, නුගේගොඩ
සංස්ථාපිත දිනය : 2011.04.07.

සමාගමේ ලේකම්.

06-256

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බවට අපි මෙයින් නිවේදනය කරමු :-

සමාගමේ නම : ස්ටයිලීන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 76448
ලියාපදිංචි කාර්යාලය : ආරිගල පාර, මීගොඩ
සංස්ථාගත කිරීමේ දිනය : 2011 ජනවාරි 07.

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-287

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වැනි වගන්තිය යටතේ වූ විධිවිධාන අනුව සීමාසහිත සමාගමක් වශයෙන් සංස්ථාපනය කිරීමයි.

සමාගමේ නම : බ්‍රෑන්ඩ් ක්‍රියේෂන්ස් ඇන්ඩ් ඉවෙන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 50 ඒ, රණවිරු මාවත, දෙහිවල පාර, පැපිලියාන
සමාගමේ අංකය : පී වී 74534
සංස්ථාගත දිනය : 2010 සැප්තැම්බර් 28.

සමාගමේ ලේකම්.

06-275

---

## ඇටෝර්නි බලපත්‍රය අවංලගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බොරලැස්ගමුව, කටුවාවල, දවටගහවත්ත පාර, අංක 110/6 දරන තැන පදිංචි දොන් චාමින්ද දිනේෂ් කුමාර අබේපිටිය (ජා. හැ. අංක 742000192 V) වන මම, නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එම්. ජයනි සමරතුංග විසින් ලියා සහතික කරන ලද අංක 70 සහ 2009 පෙබරවාරි මස 25 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය මගින් මාගේ ඇටර්නි බලකරු ලෙසට බොරලැස්ගමුව, කටුවාවල, ඇහැලපේ පාර, අංක 105/7 දරන තැන පදිංචි දෝන රුක්ෂානි අංජුනි අබේපිටිය යන අයට කරන ලද පත්වීම මෙයින් අවලංගු කරන අතර මින් මතු ඇය විසින් මා වෙනුවෙන් කරනු ලබන කිසිදු ක්‍රියාවක් පිළිබඳ ව මා විසින් වග නොකියන බවට දැනුම් දෙනු ලැබේ.

දොන් චමින්ද දිනේෂ් අබේපිටිය.

06-292

---

## වගකීමෙන් සීමිත සමාගමක් සංස්ථාගත කිරීමේ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙයින් දැනුම්දෙනු ලැබේ.

සමාගමේ නම : ජේ. එල්. එම්. ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83968
සංස්ථාගත කළ දිනය : 2012 ජනවාරි මස 27
ලියාපදිංචි ලිපිනය : අංක 88/1, ජයපුර පටුමග, බත්තරමුල්ල.

කොරුව කන්කානම්ගේ දොන් ගිහාන් සුරංග ජයවර්ධන,
ලේකම්.

2012 පෙබරවාරි මස 09 වැනි දින,
අංක 98/7/2, නාමල් මාවත,
කහන්තොට පාර,
මාලබේ.

06-293

---

## අංක 677, ඇටෝර්නි බලපත්‍ර අවලංගු කිරීම

මධ්‍යම පළාතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ නුවරඑළිය, හාලි-ඇල, අංක 677, හි පදිංචිව සිට දැනට 152, මහින්ද මාවත, හාවෙළිය නුවරඑළිය, මුත්තුලිංගම් විජයරත්නම් වන මා විසින් වර්ෂ 2008 ක් වූ ජූලි මස 05 වැනි දින අංක 4224 ලිංගකොඩිවේල් මිත්‍රා විසින් ලියා සහතික කරන ලද ඇටෝර්නි බලකරය 2012.05.23 මත ලබාදුන් ඇටෝර්නි බලය මෙයින් අවලංගු කර ඇති බව මහජනතාව සහ ශ්‍රී ලංකා රජයට මෙයින් දැනුම් දෙමි.

තව ද, මෙම දිනයෙන් පසුව මේ සම්බන්ධයෙන් යම් ක්‍රියාවක් කර ඇත්නම් එයට මා වග නොකියන බව දන්වමි.

මුත්තුලිංගම් විජයරත්නම්.

06-330

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 වැනි වගන්තිය යටතේ වූ විධි විධාන අනුව සීමාසහිත සමාගමක් වශයෙන් ලියාපදිංචි කිරීමයි

සමාගමේ නම : ලෙවිට් සෙලැන්ඩ් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය : පීවී 85620
ලියාපදිංචි කළ දිනය : 2012.04.24
සමාගම ලියාපදිංචි ලිපිනය : අංක 155/බී/පිංවත්ත, මැටරඹ, උණවටුන.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලේකම්.

06-283

## ප්‍රසිද්ධ දැන්වීමයි

පහත සඳහන් වගකීමෙන් සීමිත සමාගම් 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ :-

| *සමාගමේ නම* | *පීවී අංකය* | *ලියාපදිංචි කළ කාර්යාලය* |
|---|---|---|
| බර්ක් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී85547 | සෙක්‍රටේරියල්හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05 |
| මොරිස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 85560 | එම |
| පින්ග් ටින්ග් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 85900 | එම |
| වයිට් බේ (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 85928 | එම |

සමාගම් ලේකම්වරු.

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

06-282

---

## සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ප්‍රින්ටොලොජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 85596
සංස්ථාගත කළ දිනය : 2012 අප්‍රේල් 24
ලියාපදිංචි කාර්යාලය : බිම් මහල, අංක 98, හැව්ලොක් පාර, කොළඹ 05.

චාට් බිස්නස් සිස්ටම්ස්(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගමේ ලේකම්වරු,

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-288/1

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගමේ නම 2012 අප්‍රේල් 20 දින සිට ක්‍රියාත්මක වන පරිදි 8 වැනි වගන්තියට අනුගාමීව වෙනස් කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තියට අනුගාමීව මෙයින් ප්‍රසිද්ධියේ නිවේදනය කරනු ලැබේ :-

සමාගමේ කලින් තිබූ නම : එල්. ජේ. ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංක
සමාගම් අංකය : පීවී11010
සමාගමේ ලිපිනය : අංක 53 ඒ, කොස්සින්නවත්ත, කටුවාවල, බොරලැස්ගමුව
සමාගමේ නව නාමය : එල්. ජේ. ඉන්ටර්නැෂනල් ඇග්‍රෝ (ප්‍රයිවට්) ලිමිටඩ්

චාට් බිස්නස් සිස්ටම්ස්(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

06-288/2

---

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : ලක්ෂරි විලාස් ඇන්ඩ් හොටෙල්ස් මැනේජ්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 63281
සංස්ථාගත කිරීමේ දිනය : 2008 මාර්තු 04
ලියාපදිංචි කාර්යාලය : අංක 40/2, ලේක් ගාර්ඩන්ස්, ශ්‍රී ජයවර්ධනපුර පාර, රාජගිරිය.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

06-288/3

---

## සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : රෆල්ස් ලෙෂර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 69588
සංස්ථාගත කිරීමේ දිනය : 2009 ඔක්තෝබර් 15
ලියාපදිංචි කාර්යාලය : අංක 03, ශ්‍රී සුනන්දාරාම පාර, කළුබෝවිල, දෙහිවල.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,

අංක 141/3, වොක්ෂෝල් වීදිය. කොළඹ 02.

06-288/4

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

1. සමාගමේ නම : බාක් ස්ට්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. අංකය : පී. වී. 85938
3. ලියාපදිංචි ලිපිනය : අංක 40/6, ලේක් ගාඩ්න්, ලේක් ඩ්‍රයිව්, රාජගිරිය
4. ලියාපදිංචි දිනය : 2012.05.14

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
සමාගමේ ලේකම්.

නීතිඥ, සමාගමේ ලේකම්,
බාක් ස්ට්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්.

06-285

---

## සමාගමේ නාමය වෙනස්වීම පිළිබඳව, 2007 සමාගම් පනතේ අංක 7 හි 9(2) කොටසට අනුකූලව කෙරෙන පොදු නිවේදනයයි

සමාගමේ පෙර නාමය : ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං පීඑල්සී
සමාගමේ අංකය : PB14PQ
සමාගමේ නව නාමය : ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී
ලියාපදිංචි ලිපිනය : නො. 185, යූනියන් පෙදෙස, කොළඹ 02.

ඩී. ද සිල්වා මිය,
සමාගම් ලේකම්.

06-258

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2012 මාර්තු මස 13 දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : කේ. කේ. ආර්. කන්සල්ටිං (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී. වී. 84823
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 377/4, තලංගම උතුර, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙක්ට්‍රීස් (පුද්ගලික) සමාගම.

06-260

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : එච් එල් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : PV85775
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 7/10, පළමු පටුමග, ගල්පොත්ත, නාවල.
ලියාපදිංචි කළ දිනය : 2012.05.03

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,

06-246/1

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : බෙවරේජ් ඇසෝසියේෂන් ඔෆ් ශ්‍රී ලංකා
සමාගමේ අංකය : GA2690
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
ස්ථාපිත කළ දිනය : 2012. අප්‍රේල් 18

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
සමාගම් ලේකම්වරු,

06-246/2

---

## ඇටර්නි බලය නිවාරය කිරීම

කොළඹ 01, ජනාධිපති මාවතේ, අංක 41 හි ආනන්දි ක්‍රිෂ්ණජිනා ගුණවර්ධන වන මා හට එක්සත් රාජධානියේ, ලීඩ්ස් LS11 5AD සවුත් බෑන්ක්, ග්රේට් විල්සන් වීදිය, ASDA හවුස් යන ස්ථානයේ ජෝර්ජ් සෝර්සින් සර්විසස් යූකේ ලිමිටඩ් සමාගම (එක්සත් රාජධානියේ සංස්ථාපනය කරන ලදුව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ විදේශ සමාගමක් ලෙස ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාරික ස්ථානයක් ලියාපදිංචි කරන ලද සමාගමකි) විසින් 2012 මාර්තු මස 13 වැනි දිනැතිව ස්ටීවන් ඒ ප්‍රයිස් ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් සහතික කරන ලදුව, 2012 මාර්තු මස 19 වැනි දින කොළඹ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ඇටර්නි බලය යටතේ කටයුතු කිරීම මා විසින් නිවාරය කර ඇති බවත්, එකී ජෝර්ජ් සෝර්සින් සර්විසස් යූකේ ලිමිටඩ් සමාගම මින් ඉදිරියට එකී ඇටර්නි බලය යටතේ සිදු කරන කිසිදු ගණුදෙනුවකට වගකීමක් නොදරන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව හා රජය වෙත මෙයින් දන්වා සිටිමි.

ආනන්දි ක්‍රිෂ්ණජිනා ගුණවර්ධන.

06-249

### නිවේදනයයි

**සොෆ්ලොජික් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

2012 අප්‍රේල් මස 05 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිය නාමය සොෆ්ලොජික් ලෙෂර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාර මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සොෆ්ලොජික් ලෙෂර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 14247
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 14, ද පොන්සේකා පෙදෙස, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සොෆ්ලොජික් ලෙෂර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

06-247

### නිවේදනයයි

අංක 7/2007 දරන සමාගම් පනතේ 9 වගන්තිය යටතේ සංස්ථාගත කරන ලද නව සමාගමක් පිළිබඳ පුවත්පත් දැන්වීමයි

නම : ඒවියේෂන් වර්ල්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 26/12, මිෂන් ලේන්, කෝට්ටේ.
ලියාපදිංචි අංකය : පී. වී. 85452
සංස්ථාගත කළ දිනය : 2012.04.10

සමාගමේ ලේකම්.

06-248

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සෙලාන් බැංකුව පීඑල්සී - මීරිගම ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ දෙදෙනාම මීනුවන්ගොඩ පදිංචි අහමඩ් මුසින් මොහොමඩ් ෆයිස් සහ මොහොමඩ් යුසුප් ෆරිසා බිබී හෙවත් මොහොමඩ් යුසුප් ෆරිසා බිබී ෆයිස් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීනුවන්ගොඩ අංක 256 තක්කියා පාර, ගල්ලොලුව හි පිහිටි පර්චස් විස්සයි දශමපහක් (අ. 0 රූ. 0 පර්. 20.5) විශාල නිවසක් ද සහිත වටිනා දේපළ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ ඇතුළු අනෙකුත් සියලුම දේ සමග ඉඩම.

ඉහත සඳහන් දේපළ 2012 ජුනි මස 28 වැනි දින පෙරවරු 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මීනුවන්ගොඩ නගර මධ්‍යයේ සිට කොළඹ පාර ඔස්සේ කි. මී. 1ක් පමණ ගොස් ගල්ඔලුව මංසන්ධියට පැමිණ දකුණු පසට ඇති ලුම්බිණි පන්සල පාරට හැරී තවත් මීටර් 800ක් පමණ ගොස් වම්පසට ඇති තක්කියා පාරට හැරී මද දුරක් ගිය විට පාරේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.- රජයේ ගැසට් පත්‍රයේ* 2009.10.30 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2009.10.12 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2009.10.15 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* -සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක් 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමණාකරු (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක 011- 2456480, 2456482, 2456484.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොළොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011-2572940.

06-365

---

**මහජන බැංකුව - මූලස්ථාන ශාඛාව 204 සහ ආයතනික ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොටුවේ පිහිටි සර් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි අංක 20 1/2 රිජන්ට් ෆ්ලැට්ස් (තට්ටු නිවාස) බලයලත් මිනින්දෝරු ඩී. එස්. හෙට්ටිගේ මහතා විසින් මැන සාදන ලද ප්‍රන්ත සැලැස්ම අංක 421 1976.12.20 දින දරන පළවෙනි මහලේ ඒකක 3 ප්‍රමාණය වර්ග අඩි 1464ක් වේ.

ඉහත සඳහන් දේපළ මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය මත ම විසින් 2012 ජුනි මස 24 වැනි දින පෙ. ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ පිහිටි ස්ථානයේ දී විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා 2010.11.04 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ,* සහ 2010.10.20 වැනි දින ඩේලිනිව්ස් සහ දිනමිණ පුවත්පත්වල ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - කොළඹ කොටුව ලේක්හවුස් වටරවුමේ රීගල් සිනමාහල පැත්තට රිජන්ට් ප්ලැට්ස් නමැති ගොඩනැගිල්ල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසියේ අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

(1) ගැණුම් මිලෙන් 10%ක්,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 01%ක්,
(3) වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 02 1/2%ක්,
(4) ලිපිකරු හා නිවේදක ගාස්තු වශයෙන් රු. 1,000ක් ,
(5) විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
(6) විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ දකුණ කලාපීය ප්‍රධාන කාර්යාලය, අංක 11, ආදිපාද වීදියේ, මහජන බැංකු ප්‍රාදේශීය කළමනාකරු (කොළඹ දකුණ) වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2393678
ෆැක්ස් අංකය : 011- 4717009

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත සඳහන් ලිපිනයෙන් ලබා ගත හැකිය.

ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් මුදල දින 30ක් ඇතුළත නොගෙව්වහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා (සාම විනිසුරු),
මහාධිකරණ සහ දිසා අධිකරණ උසාවි කොමසාරිස්,
අධිකරණ හා රාජ්‍ය බැංකු වෙන්දේසිකරු,
තක්සේරුකරු, හා දිවුරුම් ලත් භාෂා පරිවර්තක.

අංක 03,
පාගොඩ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 2810145, 0718 - 021206.

06-381

---

SEY 21-12

**සෙලාන් බැංක් පී.එල්.සී - ත්‍රිකුණාමලය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ, ත්‍රිකුණාමලය සිය ලියාපදිංචි අංක පී. වී. 65579 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් වන මෙසස් සිතමු (ප්‍රයිවට්) ලිමිටඩ්, කින්නියා පදිංචි දේශබන්දු බාලසිංහම් ජනරාජන් දේශබන්දු අබ්දුල් සමාදු නසීර්, ත්‍රිකුණාමලය පදිංචි දේශබන්දු ආචාර්ය/වෛද්‍ය පද්මනාදන් සුරේශන් කන්තවේල් ත්‍රිකුණාමලය පදිංචි කුලේන්දිරන් කුලදීපන් ත්‍රිකුණාමලය පදිංචි යෝගකුමාරි සිවපාලන් නිලාවැලි පදිංචි කුමාරාජරත්නම් රත්නකුමාර ත්‍රිකුණාමලය පදිංචි ජනාබ් අමීර සුල්තාන් අබ්දුල් හමීඩ්, ත්‍රිකුණාමලය පදිංචි හෙට්ටි තන්ත්‍රිගේ සරත් චන්ද්‍ර විජේසූරිය සහ ත්‍රිකුණාමලය පදිංචි සෙල්වරාසා ජෙගදීසන් යන අය විසින් යථෝක්ත බැංකුවට අයවිය යුතු මුදල් ගෙවීම බන්ධනදායීන් ලෙස පැහැරහැර ඇති බැවින්, නැගෙනහිර පළාතේ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තම්පලකාමම් ප්‍රාදේශීය ලේකම්ගේ කොට්ඨාසය තුල තම්පලකාමම් ප්‍රාදේශීය සභා සීමාව තුළ තම්පලකාමම් පත්තුවේ තම්පලකාමම් 13 වැනි සැතපුම් කණුවෙහි (ත්‍රිකුණාමලය සිට කොළඹ පාර දැන් 1 වැනි සැතපුම් කණුව) පිහිටි ත්‍රිකුණාමල බලයලත් මිනින්දෝරු සහ තලම්තිකරු එස්. ගෝ පාලක්‍රිෂ්ණන් විසින් සාදන ලද 1981.12.05 දිනැති අංක 208 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ලකුණු කළ පුදුකුඩිඉරුප්පු වේනෙයි නමැති අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසිතුනයි දශම නවයයි බිංදුවක් (අ. 1 රූ. 3 පර්. 23.90) නොහොත් හෙක්ටයාර් 7687 ක් විශාල ඉඩම් ගොඩනැගිලි සහ මෙමගින් උකස්කර ඇති උකසට අදාළ සියලු අයිතීන් සමග ඉඩම.

වර්ෂ 2012ක් වූ ජුනි මස 29 වැනි දින ප. ව. 1.30 ට අදාළ ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ප්‍රවේශය.-* ත්‍රිකුණාමලය මහනුවර පාරේ, තම්පලගාමම් හන්දිය දක්වා ගමන් කොට, ඉන් වමට හැරී, කින්නියාවට යන පාරේ කිලෝ මීටරයක් පමණ ගමන් කරන්න. එම පාරේ වම් පැත්තට මායිම්ව, කන්තලේ වැවෙන් එන ප්‍රධාන ඇල මාර්ගය මෙම පාර හරහා දිවෙන තැන අදාළ දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය(10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000ක්) ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නො ගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ප්‍රධාන කළමණාකරු නීති දෙපාර්තමේන්තුව, සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලුපාර, කොළඹ 03 (දුරකථන අංකය : 011-2456480 2456458)

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 156 -1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777-378441 071-4424478
2012.06.08 දින දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රය* ද බලන්න.

06-379

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.